## ග්‍රාමීය හා නාගරික සංවර්ධන, නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

## ප්‍රසම්පාදන අංකය S/611/24



# පාගොඩ තෙත් බිම් උද්‍යානය ආශ්‍රිත ඇවිදින මංතීරු පරිශ්‍රයේ මාසික කුලී පදනම මත ආහාරපාන නිෂ්පාදන අලෙවිකිරීම සඳහා වෙළඳ කුටි 02 ක් ඉදිකිරීම් කටයුතු සිදුකර (වෙළඳ කුටි අංක 01 හා අංක 02) පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම

**ලංසු කැඳවීම අවසන් කිරීම**

**දිනය : 2025.01.24**

**වේලාව : ප.ව.01.30**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැපයුම්)
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය
දුරකථන : 011-2866832

## මාර්ග සිතියම සහ ස්ථාන සිතියම

පාගොඩ තෙත් බිම් උද්‍යානය ආශ්‍රිත ඇවිදින මංතීරු පරිශ්‍රය



අත්‍යාවශ්‍යම ලිපිගොණු පරීක්ෂාව

- 10 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ අත්සන් කරන ලද ප්‍රමාණ බිල්පත්‍රය ☐
- පිටු අංක 04 හි 3.5 වගන්තයෙහි සඳහන් ලංසු ඇපකරයෙහි මුල් පිටපත ☐
- පිටු අංක 06 හි 7.3 වගන්තිය අනුව සවිස්තරාත්මක ව්‍යාපාර යෝජනාව (ඇමුණුම් අංක 02,03) ☐
- අදාල ව්‍යාපාර ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ (ආහාරපාන සැකසීම,බෙදාහැරීම,අලෙවිය) ව්‍යාපාරය ලියාපදිංචි කිරීම් සහතිකයේ පිටපත ☐
- අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් ☐

**1.0 හැඳින්වීම**

1.1 සභාපති ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (මින් පසුව "සංස්ථාව" ලෙස හඳුන්වනු ලැබේ) විසින් පාගොඩ තෙත් බිම් උද්‍යානය ආශ්‍රිත ඇවිදින මංතීරු පරිශ්‍රයේ මාසික කුලී පදනම මත ආහාරපාන නිෂ්පාදන අලෙවිකිරීම සඳහා වෙළඳ කුටි 02 ක් (වෙළඳ කුටි අංක 01 හා අංක 02)ඉදිකිරීම් කටයුතු සිදුකර පවත්වාගෙන යාම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් ලංසු කැඳවනු ලබයි.

1.2 ලංසුකරුවෙකුට එක් වෙළඳ කුටියක් සඳහා හෝ වෙළඳ කුටි දෙකම සඳහා හෝ ලංසු ඉදිරිපත් කල හැක.

1.3 ආරම්භයේදී වසරක කාලයක් සඳහා ගිවිසුම් ගත වන අතර, තෝරාගත් ලංසුකරුගේ කාර්ය සාධනය පදනම් කර ගනිමින්, එම ගිවිසුම වසර 03 ක් දක්වා දීර්ඝ කිරීමේ හැකියාව පවතී.

**2.0 ලංසුකරුවන් සඳහා උපදෙස්**

2.1 ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) ක්‍රියාපටිපාටිය හරහා ලංසු පත්‍රිකා ඉදිරිපත් කරනු ලැබේ.

2.2 ලංසු පත්‍රිකාව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්) වෙතින් 2025/01/10 දින සිට 2025/01/23 දින දක්වා සඳුදා සිට සිකුරාදා දක්වා රජයේ නිවාඩු දින නොවන වැඩකරන දින වලදී පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා ආපසු නොගෙවන **රු 3,000/-** ගෙවා මිලදී ගත හැක.

2.3 වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා
සැලසුම් හා ව්‍යාපාර සංවර්ධන අංශය
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ,
රාජගිරිය
දුරකථනඃ 011-2871167, 011-2861170, 071-3665151, 071-0387168

2.4 මිල ගණන් ඉදිරිපත් කිරීමට නියමිත කාල සීමාවට ප්‍රථම ඕනෑම අවස්ථාවක ලිඛිතව හෝ ෆැක්ස් මාර්ගයෙන් අතිරේක ලේඛනයක් නිකුත් කිරීම මගින් ලංසු පත්‍රිකාව සංශෝධනය කිරීමට සංස්ථාවට හැකියාව පවතී.

2.5 ලංසුකරුවන් විසින් "ව්‍යාපාරික යෝජනාවක්" ඉදිරිපත් කල යුතුය. එම ව්‍යාපරික යෝජනාවෙහි, වෙළඳ කුටියෙහි ප්‍රමාණය (වර්ග අඩි 200 කට වැඩි නොවිය යුතුය ) විස්තර වන පිරිවිතර (Specification), රූපයක්, විකිණීමට ඇති ආහාර/ පාන වර්ග, වෙළඳ කුටියෙහි ස්වභාවය, ක්‍රියාකරීත්වය යනාදිය ඇතුළුව සවිස්තරාත්මක විස්තරයක් ඇතුලත්විය යුතුය. මෙම වෙළඳ කුටි උද්‍යාන පරිශ්‍රයේ සෞන්දර්යාත්මක පෙනුමට බාධා නොවන අයුරින් හා ඊට සර්ලන ආකාරයට නිමවිය යුතුය. ලංසුකරු විසින් ඉදිරිපත් කර අති වෙළඳකුටියෙහි ස්වභාවය වෙනස් කිරීමට සංස්ථාව විසින් යෝජනා කිරීමේදී, ලංසුකරු ඊට එකඟ විය යුතුය.

Read Only

2.6 සෑම ලංසුකරුවෙක්ම තම ලංසුව ඉදිරිපත් කිරීමට ප්‍රථම අදාල වෙළඳ කුටි පිහිටුවීමට ඇති ස්ථාන (පිටු අංක 01,ස්ථාන සිතියම) සහ ඒ අවට පරීක්ෂා කිරීම සදහා උපදෙස් ලබා දෙන අතර එසේ පරීක්ෂා කිරීම සඳහා අදාල ස්ථානයට පැමිණීමේ පිරිවැය ලංසුකරු විසින් දැරිය යුතුවේ.

2.7 සෑම ලංසුකරුවෙක්ම තම ලංසුව පිළියෙල කිරීම සඳහා දරණ පිරිවැය තමන් විසින්ම දැරිය යුතුය. මෙම සංස්ථාව එවැනි කිසිදු ආකාරයේ පිරිවැයක් දැරීමට යටත් නොවන අතර, ලංසුකරු දරණ පිරිවැය නැවත ගෙවීමක්ද සිදු නොකරයි

2.8 ලංසුකරුවෙකුට එක් වෙළඳ කුටියක් සඳහා හෝ වෙළඳ කුටි දෙකම සඳහා හෝ ලංසු ඉදිරිපත් කල හැක. එනමුත්, එක් ලංසුකරුවකුට වෙළඳ කුටි අංක 01 හෝ අංක 02 සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් ලංසුවක් පමණි. එසේ එක් ලංසුකරුවකු වෙළඳ කුටි අංක 01 හෝ අංක 02 සඳහා ලංසු කිහිපයක් ඉදිරිපත් කළහොත් එම ලංසුකරුගේ සියළු ලංසු ප්‍රතික්ෂේප වේ.

2.9 කිසියම් ලංසුකරුවෙකු එක් වෙළඳ කුටියක් සඳහා හෝ ලබාදී ඇති ලංසුව ඉවත් කර ගතහොත්, 3.5 හි සඳහන් රු. 30,000/- සම්පූර්ණ ලංසු ඇපකරය සංස්ථාව සතු වේ.

2.10 ලැබෙන ලංසු හි මිල අගයන් සැලකිල්ලට ගනිමින් සංස්ථාවට උපරිම ආර්ථික ප්‍රතිලාභය ලැබෙන වෙළඳ කුටි ලබාදීම සිදු කිරීමේ අයිතිය සංස්ථාව සතු වේ.

## 3.0 ලංසු පත්‍රිකා පිළියෙල කිරීම

3.1 ලංසුකරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලංසු පත්‍රිකාවේ සඳහන් කරුණු පැහැදිලිව සම්පූර්ණ කල යුතුය.

3.2 ලංසුව ඉදිරිපත් කිරීමේදී ලංසු පත්‍රිකාවේ වූ පහත තොරතුරු සහලිපි ලේඛන සම්පූර්ණ කළ යුතුය.

I. අංක 10 පිටුවෙහි සඳහන් පරිදි නිවැරදිව සම්පූර්ණ කර අත්සන් කරන ලද ප්‍රමාණ බිල්පත්‍රය
II. පිටු අංක 04 හි 3.5 වගන්තිය අනුව ලංසු ඇපකරයෙහි මුල් පිටපත
III. පිටු අංක 06 හි 7.3 වගන්තිය අනුව සවිස්තරාත්මක ව්‍යාපාර යෝජනාව (ඇමුණුම් අංක 02 සහ 03)
IV. අදාල ව්‍යාපාර ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වු (ආහාරපාන සැකසීම, බෙදාහැරීම, අලෙවිය) ව්‍යාපාරය ලියාපදිංචි කිරීම් සහතිකයේ පිටපත
V. අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ ජාතික හැදුනුම්පතෙහි පිටපතක්

3.3 ඊට අමතරව පහත සඳහන් දෑ ඉදිරිපත් කිරීම (ලිඛිත සාක්ෂි සහිතව) ලංසු ඇගයීමේදී ලංසුකරු හට වාසිදායක කරුණු වේ.

i. මේ හා සමාන ව්‍යාපාරික කාර්යයන්හි පළපුරුද්ද (වසර 03 ක) සහ පළපුරුදු කාර්යය මණ්ඩලයක් සිටීම
ii. තමාටම හිමි වෙළඳසැල් පවත්වාගෙන යෑම

3.4 **ලංසුවෙහි වලංගුභාවය**

ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලංසු 2025/03/28 දින දක්වා වලංගු වන අතර, අවශ්‍ය වන අවස්ථාවකදී ලංසුවේ වලංගු කාල සීමාව දීර්ඝ කිරීමට සංස්ථාවට බලය තිබේ.

3.5 **ලංසු ඇපකරය**

Read Only

ලංසු ඇපකරයෙහි වටිනාකම රු. 30,000/- කි. එම ලංසු ඇපකරය 2025/04/25 දක්වා වලංගු විය යුතුය. එම ලංසු ඇපකරය ලබාදීම පහත පරිදි සිදු කල යුතුය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වානිජ බැංකුවකින් ලබාගත් ලංසු ඇපකරයක්. (ආදර්ශ ආකෘතිය ඇමුණුම 01 දක්වා ඇත).
හෝ,
ලංසුකරු විසින් මුදලින් ඇපකර ඉදිරිපත් කරන්නේ නම් සංස්ථාවෙහි ගිණුම් අංශය වෙත ගෙවීම් සිදුකිරීම.

වානිජ බැංකුවකින් ලබාගත් ලංසු ඇපකරයහි මුල් පිටපත හෝ සංස්ථාවෙහි ගිණුම් අංශය වෙත ගෙවීම් සිදුකර ලබාගත් ලදුපතෙහි මුල් පිටපත ඉදිරිපත් කරන ලංසු පත්‍රිකාව සමඟ ඇමිණිය යුතුය.

3.6 ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් පවත්වන පෙර ලංසු රැස්වීම 2021/01/21 දින ප.ව.01.30 ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙහි සැලසුම් හා ව්‍යාපාර සංවර්ධන අංශයේදී පැවැත්වේ. එහිදී ලංසුකරුට/ලංසුකරුවන්ට යම් ගැටළුවක් වේ නම් එම ගැටළුව රැස්වීම් දිනයේදී හෝ රැස්වීම පැවැත්වීමට නියමිත දිනට පෙර ලිඛිතව හෝ විද්‍යුත් තැපෑල මගින් ඉදිරිපත් කළ යුතුය.

3.7 තෝරාගත් ලංසුකරුට පහත සඳහන් ආහාර වර්ග **පමණක්** විකිණීම සඳහා අවසර ලබාදේ.

| **වෙළඳ කුටි අංකය** | **අවසරලත් ආහාර අයිතම වර්ග** | **අවම මාසික කුලිය එක් වෙළඳ කුටියක් සඳහා (බදු නොමැතිව) (රු.)** |
|---|---|---|
| 01 / 02 | නැවුම් පළතුරු බීම වර්ග, ෆලූඩා වර්ග, ස්මූති වර්ග සහ පළතුරු සලාද, බර්ගර්, හොට්ඩෝග්, සබ්මැරීන් වර්ග සහ සැන්ඩ්විච් වර්ග, කිරි ආශ්‍රිත ආහාර හා බීම වර්ග ,අයිස් ක්‍රීම්, වතුර බෝතල්,ඖෂධීය කැඳ වර්ග. | 25,000.00 |

3.10 ව්‍යාපාරික කටයුතු සිදු කරගෙන යෑම සඳහා අවශ්‍ය උපකරණ කිසිවක් සංස්ථාව විසින් ලබා නොදෙන අතර, අවශ්‍යකරන සියළුම උපකරණ ලංසුකරු විසින්ම තම වියදමින් සපයා ගත යුතුය.

3.11 **අවම මාසික කුලිය**

එක් වෙළඳ කුටියක් සඳහා අදාළ අවම මාසික කුලිය ඉහත 3.7 වගුවෙහි සදහන් පරිදි රු. 25,000/- වේ. මෙම අවම මාසික කුළියට සමාන හෝ වැඩි අගයක් ලංසුකරු විසින් ඉදිරිපත් කළ යුතු වේ. අවම මාසික කුලියට වඩා අඩුවෙන් තබා ඇති ලංසු ප්‍රතික්ෂේප වනු ඇත .

3.12 **මාසික නඩත්තු ගාස්තුව**

පිටු අංක 09 හි ලංසුකරු විසින් සඳහන් කර ඇති **මාසික කුලී මුදලට අමතරව**, තෝරාගත් ලංසුකරු විසින් **මාසික නඩත්තු ගාස්තුව වන රු.10,000/- (එක් වෙළඳ කුටියක් සඳහා)** ක මුදල ගෙවිය යුතුය. මෙම නඩත්තු ගාස්තුව සංස්ථාව විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලබන අතර එය සංශෝධන වලට යටත් වේ.

3.13 **විදුලි ගාස්තුව**

වෙළඳ කුටි සඳහා විදුලි මීටර සවි කිරීම තෝරාගත් ලංසුකරු විසින් සිදු කල යුතු අතර, වෙළඳ කුටියෙහි මාසික පරිභෝජනය පදනම් කර ගනිමින් විදුලි බිල්පත් ගාස්තු සංස්ථාව මගින් සකසනු ලැබේ. තෝරාගත් ලංසුකරු විසින් වෙළඳ කුටි වලට අදාලව සංස්ථාව විසින් ලංසුකරු වෙත යොමු කරනු ලබන විදුලි බිල්පත් ගාස්තු, මාසික වෙළඳ කුටි ගාස්තු සමඟ ගෙවිය යුතුය.

**වෙළඳ කුටිය සඳහා ජලය සැපයීම සංස්ථාව මඟින් සිදු නොකෙරේ.**

## 4.0 ලංසු ඉදිරිපත් කිරීම

ReadOnly

4.1 ලංසුකරුවන් තම ලංසුව මුද්‍රා තබන ලද ලියුම් කවරයක් තුල ඉදිරිපත් කල යුතුය.

4.2 ලංසු ඇපකරය මුදලින් ගෙවීම සිදුකරයි නම් එම රිසිට්පත හෝ බැංකු ඇපකරයෙහි **<u>මුල් පිටපත</u>** ලංසු පත්‍රය සමඟ අමුණා තිබිය යුතුය.

4.3 ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරෙහි "**ප්‍රසම්පාදන අංක S/611/24**" සහ "**පාගොඩ තෙත් බිම් උද්‍යානය ආශ්‍රිත ඇවිදින මංතීරු පරිශ්‍රයේ මාසික කුලී පදනම මත ආහාරපාන නිෂ්පාදන අලෙවිකිරීම සඳහා වෙළඳ කුටි 02 ක් (අංක 01 හා අංක 02)ඉදිකිරීම් කටයුතු සිදුකර පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම**" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

4.4 ලංසුව බහා ඇති ලියුම් කවරයේ පහත ලිපිනය සඳහන් කළ යුතුය.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,**
**වැලිකඩ, රාජගිරිය**

සියළුම ලංසු ඉහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීම <u>හෝ</u> පහත ලිපිනයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

**සැපයුම් අංශය,**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,**
**වැලිකඩ, රාජගිරිය**

4.5 ලංසු පත්‍රිකා භාරගැනීම 2025/01/24 දින ප.ව. 01.30 ට අවසන් වීමට නියමිත වන අතර එම වේලාව ඉක්මවූ වහාම සියළුම ලංසු විවෘත කරනු ලැබේ. සංස්ථාවේ අභිමතය පරිදි අවශ්‍ය නම් අදාල දිනය දීර්ඝ කළ හැක.

4.6 ලංසු ඉදිරිපත් කිරීම සඳහා සපයා ඇති අවසන් දිනට සහ වේලාවට පසුව ඉදිරිපත් වන සියළුම ලංසු ප්‍රතික්ෂේප වන අතර, එම ලංසු ලංසුකරු වෙත ආපසු යවනු ලැබේ.

4.7 ලංසුවක් ඉදිරිපත් කිරීමෙන් පසුව එම ලංසුව වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට කිසිදු ලංසු කරුවෙකුට අවසර හිමි නොවනු ඇත. ලංසුව භාරදීමෙන් අනතුරුව ලංසුවල වලංගු කාල සීමාව තුල කිසියම් ලංසුකරුවෙකු විසින් තම ලංසුව ඉවත් කර ගනනේ නම්, 3.5 හි සඳහන් අදාල ලංසු ඇපකරය සංස්ථා සන්තක වේ.

## 5.0 <u>ලංසු විවෘත කිරීම සහ ඇගයීම</u>

5.1 ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබාදී තිබූ අවසන් දින එම වේලාව ඉක්මවූ වහාම සියළුම ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් පැමිණීමේ ලේඛණය අත්සන් කිරීම මගින් ඔවුන්ගේ පැමිණීම තහවුරු කළ යුතුය.

5.2 ලංසුකරුගේ නම, ඉදිරිපත් කර ඇති මාසික කුලී අගය, ලංසු ඇපකරය සහ අවශ්‍ය අනෙකුත් තොරතුරු එම අවස්ථාවේදී ප්‍රකාශ කරනු ඇත.

5.3 මාසික කුලී මුදල ප්‍රමාණ බිල්පතෙහි අකුරෙන් සහ ඉලක්කමෙන් ලිවීම අනිවාර්යය වන අතර, ඕනෑම ගැටළු සහගත තත්ත්වයකදී අකුරින් සඳහන් අගය බලපවත්වන්නේය.

5.4 ලංසුකරු ඉදිරිපත් කර ඇති ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ආහාරපාන සැපයීම, බෙදාහැරීම,අලෙවිය හා සම්බන්ධ සහතිකයක් නොවන්නේනම් මූලික ලංසු ඇගයීමේදීම එම ලංසුව අවලංගු වනු ඇත.

5.5 ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පරීක්ෂා කිරීම ලංසු සැසඳීම හා ඇගයීම සම්බන්ධ තොරතුරු පැහැදිලි කිරීම, කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා ඉදිරිපත් කර නිර්දේශ යනාදිය ලංසුකරු වෙත අනාවරණය නොකරනු ඇත. ලංසු කැඳවීම හා ඒ සම්බන්ධ තීරණ ගැනීමේ සංස්ථාවේ ක්‍රියාවලියට බලපෑම් කිරීම සඳහා ලංසුකරු විසින් දරණ ඕනෑම ප්‍රයත්නයක්, එම ලංසුකරු විසින් ලබාදී ඇති ලංසුව ප්‍රතිකේෂප වීමට හේතු වේ.

## 6.0 <u>කොන්ත්‍රාත්තුව පිරිනැමීම හා ව්‍යාපාර කටයුතු ආරම්භය</u>



Read Only

6.1 ඉදිරිපත් කර ඇති ලංසු වල වලංගු භාවය ඉකුත් වීමට ප්‍රථම සංස්ථාව විසින් තෝරාගත් ලංසුකරු වෙත ඔහුගේ ලංසුව පිළිගත් බව සඳහන් කරමින් "ව්‍යාපාරය ප්‍රදානය කිරීමේ ලිපිය" ලියාපදිංචි තැපැල් මගින් යොමු කරනු ඇත. එසේ නැතහොත්, එම තෝරාගත් ලංසුකරු සංස්ථා ප්‍රධාන කාර්යාලයට පැමිණ සැලසුම් හා ව්‍යාපාර සංවර්ධන අංශය වෙතින් තම අනන්‍යතාවය තහවුරු කර එකී "ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපිය" ලබාගත හැකිය. සංස්ථාව සහ අදාල තෝරාගත් ලංසුකරු අතර විධිමත් ගිවිසුමක් අත්සන් කරන තුරු මෙම "ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපිය" නීත්‍යානුකූල ලේඛනය හෙවත් ගිවිසුම ලෙස පිළිගනු ලබන්නේ ය.

6.2 වෙළඳ කුටිය ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කල දින සිට දින 14 ක් තුළ ආරම්භ කළ යුතුය. එම දිනයන්හිදී ව්‍යාපාර කටයුතු ආරම්භ නොකළහොත්, මෙම ව්‍යාපාර කටයුතු හා සම්බන්ධව උනන්දුවක් නොමැති බව සලකා වෙනත් ලංසුකරුවෙකු තෝරා ගැනීම හෝ නැවත ලංසු කැඳවීමක් සිදු කිරීමට සංස්ථාව විසින් කටයුතු කරනු ලැබේ. එවිට ව්‍යාපාරය ආරම්භ කිරීමට අපොහොසත් වන තෝරාගත් ලංසුකරුගේ ලංසු ඇපකරය සංස්ථාව සතු වේ.

6.3 "ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපිය" ලබා දීමට ප්‍රථම ලංසු කැඳවීමේ ක්‍රියාවලියෙහි ඕනෑම අවස්ථාවකදී ඕනෑම ලංසුවක් හෝ සියළුම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හෝ අදාල ලංසු ක්‍රියාවලිය අවලංගු කිරීමට සංස්ථාව සතුව බලය පවතින අතර, එහිදී එම ක්‍රියාව පිළිබඳව විමසීමට ලංසුකරුවන්ට අයිතියක් නොමැත.

6.4 තෝරාගත් ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසුව හෝ ලංසුවල වලංගු කාලය ඉකුත් වීමෙන් පසුව සියළු ලංසුකරුවන්ගේ ලංසු ඇපකර නිදහස් කරනු ලැබේ.

## 7.0 නියමයන් සහ කොන්දේසි

7.1 අදාල තෝරාගත් ලංසුකරුගේ කාර්ය සාධනය පදනම් කරගනිමින් අවුරුදු පතා උපරිමය අවුරුදු 03 ක් දක්වා අලුත්කරණ ගිවිසුමක් මගින් අදාල වෙළඳ කුටි කුලී පදනම මත තෝරාගත් ලංසුකරුට ලබාදෙනු ඇත.

7.2 එලෙස සංස්ථාව විසින් තෝරාගත් ලංසුකරුගේ කාර්ය සාධනය පදනම් කර ගනිමින් සහ වසරක කාලයක් සම්පූර්ණ කල පසු **ඉදිරි වර්ෂය** සඳහා වන මාසික කුලිය ගණනයේදී **වර්තමාන වර්ෂය සඳහා ගෙවන මාසික කුලියට 10% ක් එකතු කරනු ලැබේ.**

7.3 සුදුසුකම් ලත් තෝරාගත් ලංසුකරු විසින් තමාගේ වියදමින් වෙළඳ කුටි ඉදිකළ යුතුය. ලංසුකරුවන් විසින් "ව්‍යාපාරික යෝජනාවක්" ඉදිරිපත් කල යුතුය. එම ව්‍යාපරික යෝජනාවෙහි, වෙළඳ කුටියෙහි ප්‍රමාණය (වර්ග අඩි 200 කට වැඩි නොවිය යුතුය) විස්තර වන පිරිවිතර (Specification), රූපයක්, විකිණීමට ඇති ආහාර/ පාන වර්ග, වෙළඳ කුටියෙහි ස්වභාවය, ක්‍රියාකාරිත්වය යනාදිය ඇතුළුව සවිස්තරාත්මක විස්තරයක් ඇතුලත්විය යුතුය.

මෙම වෙළඳ කුටි උද්‍යාන පරිශ්‍රයේ සෞන්දර්යාත්මක පෙනුමට බාධා නොවන අයුරින් හා ඊට සරිලන ආකාරයට නිමවිය යුතුය. ලංසුකරු විසින් ඉදිරිපත් කර ඇති වෙළඳකුටියෙහි ස්වභාවය වෙනස් කිරීමට සංස්ථාව විසින් යෝජනා කිරීමේදී, ලංසුකරු ඊට එකඟ විය යුතුය.

7.4 තෝරාගත් ලංසුකරු විසින් මාසික කුලී ගාස්තුවට අමතරව රජයට හිමි අවස්ථානුකූලව පනවා ඇති බදු ගෙවිය යුතුය.

### 7.5 ආරක්ෂිත තැන්පතුව

තෝරාගත් ලංසුකරු විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට පෙර එක් වෙළඳ කුටියක් සඳහා රු. 50,000.00 වන ආරක්ෂිත තැන්පතුවක් තම ප්‍රථම මාසික කුලී වාරිකය සමග සංස්ථාවට ගෙවිය යුතුය.

එම තැන්පත් මුදල නිදහස් කිරීම පහත සඳහන් කොන්දේසි වලට යටත්ව සිදුවේ.

Read Only

i. තෝරාගත් ලංසුකරු විසින් ව්‍යාපාරය අඛණ්ඩව වසරක් පුරා පවත්වාගෙන යා යුතුය. සතුටුදායක කාර්ය සාධනයක් මත තවත් වසරකට ප්‍රධානය දීර්ඝ කිරීමට සංස්ථාව අදහස් කරයි නම්, ඒ බව මාස දෙකකට ප්‍රථම දැනුම් දීමට සංස්ථාව කටයුතු කෙරේ. එනමුත්,එම වසර අවසානයේදී ව්‍යාපාරයෙන් ඉවත්ව යාමට තෝරාගත් ලංසුකරු අදහස් කරයි නම්, ඒ බව සංස්ථාව වෙත දැනුම් දී, අදාල වසර අවසානයේදී ව්‍යාපාරයෙන් ඉවත්ව යා හැකිය. එහිදී ව්‍යාපාරය පවත්වාගෙන යෑමේදී සංස්ථාවට අයවිය යුතු හිඟ මාසික බදු මුදල්, විදුලි බිල් පත්‍ර වේ නම්, ඒවා තැන්පත් මුදලින් අඩුකර ඉතිරි මුදල නිදහස් කරනු ඇත. එනමුත්, ඒ වන විට සංස්ථාවට ගෙවීමට ඇති මුළු මුදල තැන්පතු මුදල ඉක්මවන්නේ නම්, එම ඉක්මවන මුදල තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාවට ගෙවිය යුතුය.

ii. තෝරාගත් ලංසුකරු විසින් කුමන හෝ හේතුවක් මත අඛණ්ඩ, දින 14 ක් තුළ ව්‍යාපාර කටයුතු සිදු නොකරන්නේ නම්, තෝරාගත් ලංසුකරු ව්‍යාපාරය හැරගියා සේ සැලකේ. එවිට තැන්පත් මුදල තෝරාගත් ලංසුකරු වෙත නිදහස් කිරීමක් සිදු නොවන අතර, එය සංස්ථාව සතු වේ. අදාල පරිශ්‍රයට අලාභයක් වී තිබේනම් එය සංස්ථාව විසින් තක්සේරු කර එම හානි මුදල සමඟ ඒ වන විට හිඟව ඇති සියළුම මුදල් තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාවට ගෙවිය යුතුය.

iii.

a. මාසිකව සංස්ථාව විසින් දැනුම් දෙනු ලබන ගෙවීම් කළයුතු නියමිත දින සිට දින 07 ක් ඇතුලත මාසික කුලී හා අදාල ගාස්තු ගෙවීමට තෝරාගත් ලංසුකරු අපොහොසත් වන්නේ නම් විදුලි සැපයුම් විසන්ධි කිරීමට සංස්ථාව සතුව පූර්ණ බලය පවතින්නේ ය.

b. ගෙවීම් කළයුතු නියමිත දින සිට දින 30 ට පසුවත් තෝරාගත් ලංසුකරු තවදුරටත් එම කුලී හා ගාස්තු ගෙවීමට අපොහොසත් වනනේ නම්, සංස්ථාව සහ තෝරාගත් ලංසුකරු අතර ඇති ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කෙරේ. අනතුරුව වහාම ව්‍යාපාරික ස්ථානය නිසි පරිදි නැවත සංස්ථාවට භාරදීමට කටයුතු කළ යුතුය.

එවිට තැන්පත් මුදල තෝරාගත් ලංසුකරු වෙත නිදහස් කිරීමක් සිදු නොවන අතර, එය සංස්ථාව සතු වේ.ඒ වන විට හිඟව ඇති සියළුම මුදල් තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාවට ගෙවිය යුතුය.

7.6 කිසියම් මාසයකට අදාළ **මාසික කුලී ගාස්තුව, නඩත්තු ගාස්තුව හා ඊට පෙර මාසයේ විදුලි ගාස්තුව අදාල මාසයට පෙර මාසයේ 25 වන දිනට ප්‍රථම ගෙවිය යුතුය.**

7.7 අගරු චෙක්පත් සඳහා රු 5,000/- ක මුදලක් අය කරනු ලබන අතර, ඉන් පසුව සිදු කරන ගෙවීම් මුදලින් පමණක් ගෙවිය යුතු වේ.

7.8 අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී සංස්ථා නිලධාරීන් විසින් වෙළඳ කුටියේ ආහාර වල ගුණත්වය හා ප්‍රමිතිය පරීක්ෂා කරන අතර විකිණීම සඳහා ඇති සියළුම ආහාර පාන වර්ග ඉතා ඉහළ ගුණත්වයකින් හා ප්‍රමිතියකින් යුක්ත විය යුතුය. තවද පරිභෝජනයට නුසුදුසු ආහාර ද්‍රව්‍ය සහ සියළුම අපද්‍රව්‍ය මෙම පරිශ්‍රයෙන් කඩිනමින් ඉවත් කල යුතුය.

7.9 ආහාර පාන වෙළඳ කුටි පවත්වාගෙන යාමේදී මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීන් විසින් නියම කර ඇති කොන්දේසි හා නීති රීති වලට යටත්ව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වූ කරුණකි. මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීන් විසින් වෙළඳ කුටි පරීක්ෂා කර ශ්‍රේණිගත කිරීමද සිදුකරනු ලබයි.

7.10 සෑම මසකදීම මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා විසින් වෙළඳ කුටි ශ්‍රේණිගත කිරීමේදී තෝරාගත් ලංසුකරු අවස්ථා තුනකදී අවම මට්ටමේ ශ්‍රේණියක් ලබා ඇත්නම්, වෙළඳ කුටිය පවත්වාගෙන යෑම සඳහා ලබාදී ඇති අවසරය අවලංගු කිරීමට සහ ආරක්ෂිත තැන්පතුව සංස්ථාව සන්තක කිරීමට සංස්ථාවට පූර්ණ බලය පවතින්නේ ය.

7.11 අදාල වෙළඳ කුටිය හෝ කොටසක් වෙනත් පාර්ශවයන් වෙත ව්‍යාපාර කටයුතු හෝ වෙනත් කටයුත්තකට ලබාදීමට තෝරාගත් ලංසුකරුට කිසිදු අයිතියක් නොමැත.

Read Only

7.12 ලංසුකරු විසින් ඉදිකිරීමට අපේක්ෂා කරන වෙළඳ කුටි දෙක සඳහා යෝජනා (ඇමුණුම් අංක 02 සහ 03) සංස්ථාව වෙත යොමුකර එය අනුමත වූ පසුව පමණක් එය ඉදිකිරීමට හැකියාව පවතින අතර, එසේ සංස්ථාව වෙත ලංසුකරු විසින් ඉදිරිපත් කරන යෝජනාව ඕනෑම අවස්ථාවකදී වෙනස් කිරීමට සංස්ථාවට හැකියාව පවති.

ඉදිකිරීමට අපේක්ෂිත කරන වෙළඳ කුටි තාවකාලික ඉදිකිරීමක් විය යුතු අතර එය ඕනෑම අවස්ථාවකදී  ස්ථානය මාරු කිරීමට හෝ ඉවත් කිරීමට හැකියාව පැවතිය යුතුය. මෙම එක් වෙළඳ කුටියක ප්‍රමාණය වර්ග අඩි 200 නොඉක්මවිය යුතුය. සියලු ඉදිකිරීම් ස්ථාන භාර නිලධාරියාගේ අධීක්ෂණය යටතේ සිදු කිරීම කල යුතුය.

7.13 අවට පරිසරය හා වෙළද ස්ථානය සෑම විටම ඉතා පිරිසිදුව හා ආකර්ෂණීයව පවත්වාගෙන යා යුතුය.

7.14 වෙළද කුටිය තුල හෝ ඒ අවට දුම්වැටි මත්පැන් හෝ වෙනත් මත්ද්‍රව්‍යය විකිණීම හෝ භාවිතය සපුරා තහනම් වේ.

7.15 තෝරාගත් ලංසුකරු විසින් ප්‍රචාරණය උදෙසා නාම පුවරු බැනර් යනාදිය වෙළඳ කුටිය තුල ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඊට ප්‍රථම එකී සියළු ප්‍රචාරණ ක්‍රම සවිස්තරව සංස්ථාව වෙත ඉදිරිපත් කොට නිසි අවසර ලබාගත යුතුය. තවද එකී සියළු ප්‍රචාරණ කටයුතු සඳහා පිරිවැය ලංසුකරු විසින් දැරිය යුතුය.

7.16 තෝරාගත් ලංසුකරු විසින් කුටිය තුල භාවිතා කිරීමට අපේක්ෂිත උපාංග සහ අනෙකුත් උපකරණ ලැයිස්තුවක් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම සංස්ථාව වෙත ඉදිරිපත් කළ යුතුය. එකී උපකරණ ආරක්ෂා කර ගැනීම තෝරාගත් ලංසුකරුගේ වගකීම වන අතර, එම භාණ්ඩ/උපකරණ සඳහා සිදුවන කිසිඳු ආකාර අලාභයකදී/අස්ථානගතවීමකදී සංස්ථාව එම හානි පූර්ණය සඳහා කිසිඳු ආකාරයකින්වත් බැඳී නොසිටී.

7.17 වෙළඳ කුටියේ සේවයට යොදා ගන්නා සේවකයින් ගණන, ඔවුන්ගේ නම්, ජාතික හැඳුනුපම්පත් අංක සහ අනෙකුත් විස්තර සහ රාජකාරී අවස්ථාවේදී භාවිතා කරන නිල ඇඳුමෙහි ඡායාරූපයක් තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාව වෙත ඉදිරිපත් කළ යුතුය.

7.18 සංස්ථාව විසින් තෝරාගත් ලංසුකරුගේ ව්‍යාපාර කටයුතු හා කාර්යසාධනය අඛණ්ඩව ඇගයීමකට ලක් කරනු ලැබේ. වසරකට පසුව ගිවිසුම අලුත් කිරීම හෝ අවලංගු කිරීමේ පූර්ණ බලය සංස්ථාව සතු වේ.

7.19 නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කිරීම හෝ නීති විරෝධී කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් සංස්ථාවට අවශ්‍ය යැයි හැගුනහොත් පරීක්ෂණයක් සිදු කර ඕනෑම තෝරාගත් ලංසුකරුවෙකු සමග ඇති ගිවිසුම අවලංගු කිරීමට අවශ්‍ය පූර්ණ බලය සංස්ථාව සතුවන අතර, එවැනි අවස්ථාවකදී ලංසුකරුගේ ආරක්ෂක තැන්පතු සංස්ථාව සන්තක වන්නේ ය.

7.20 පාගොඩ තෙත් බිම් උද්‍යාන පරිශ්‍රයේ පැවැත්වෙන වැඩසටහන් වලදී, මෙහි දක්වා ඇති ආහාරපාන වර්ග අලෙවිය සිදු කිරීමට සංස්ථාව විසින් අවසර ලබාදෙන ඕනෑම අනෙකුත් පාර්ශවයන්ට ද හැකියාව පවතී.

7.21 මෙම පරිශ්‍රය අසල මෙහි සඳහන් ආහාරපාන හෝ වෙනත් ආහාරපාන වෙළඳ කුටියක් හෝ වෙනත් වෙළඳ කුටියක්, ජංගම රථයක් ස්ථානගත කිරීමට සංස්ථාවට පූර්ණ බලය පවතී.

7.22 කසළ පිරිසිදු කිරීම සහ බැහැර කිරීම තෝරාගත් ලංසුකරු විසින් තමන්ගේ වියදමින් ක්‍රියාත්මක කළ යුතු අතර වෙළඳ රථයේ එකතු වන අපද්‍රව්‍ය/කසල සංස්ථාවේ නිලධාරීන් පෙන්වා දෙන ස්ථානයට පමණක් බැහැර කළ යුතුය.

7.23 එදිනෙදා රැස්වන අපජලය සංස්ථාව විසින් පිළියෙල කර දෙනු ලබන ස්ථානයට බැහැර කළ යුතුය.

Read Only

Read Only

## ප්‍රමාණ බිල්පත

**පාගොඩ තෙත් බිම් උද්‍යානය ආශ්‍රිත ඇවිදින මංතීරු පරිශ්‍රයේ මාසික කුලී පදනම මත ආහාරපාන නිෂ්පාදන අලෙවිකිරීම සඳහා වෙළඳ කුටි 02 ක් (වෙළඳ කුටි අංක 01 හා අංක 02) ඉදිකිරීම් කටයුතු සිදුකර පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම**

| වෙළඳ කුටි අංකය | විස්තරය | මාසික කුලිය (රු) (VAT රහිත) | වාර්ෂික කුලිය (රු) (VAT රහිත) |
|---|---|---|---|
| යෝජිත ව්‍යාපාර වර්ගය හෝ ව්‍යාපාරයේ ස්වභාවය ඇමුණුම 02 හි සඳහන් කළ යුතුය. | | | |

| | | | |
|---|---|---|---|
| 01 | ආහාරපාන නිෂ්පාදන අලෙවිකිරීමට වෙළඳ කුටි අංක 01 ඉදිකිරීම් කටයුතු සිදුකර පවත්වාගෙන යාම සඳහා පාගොඩ තෙත් බිම් උද්‍යානය ආශ්‍රිත ඇවිදින මංතීරු පරිශ්‍රය කුලියට දීම. | (a1) | |

| වෙළඳ කුටි අංකය | විස්තරය | මාසික කුලිය (රු) (VAT රහිත) | වාර්ෂික කුලිය (රු) (VAT රහිත) |
|---|---|---|---|
| යෝජිත ව්‍යාපාර වර්ගය හෝ ව්‍යාපාරයේ ස්වභාවය ඇමුණුම 03 හි සඳහන් කළ යුතුය. | | | |
| 02 | ආහාරපාන නිෂ්පාදන අලෙවිකිරීමට වෙළඳ කුටි අංක 02 ඉදිකිරීම් කටයුතු සිදුකර පවත්වාගෙන යාම සඳහා පාගොඩ තෙත් බිම් උද්‍යානය ආශ්‍රිත ඇවිදින මංතීරු පරිශ්‍රය කුලියට දීම. | (a2) | |

මාසික කුලිය සඳහා (a1) හි සඳහන් අගය අකුරින්

…………………………………………………………………………………………………… + VAT

මාසික කුලිය සඳහා (a2) හි සඳහන් අගය අකුරින්

……………………………………………………………………………………………………. + VAT

---

**සටහන්**

- ආහාරපාන වෙළඳ කුටියක් සඳහා අවම මාසික කුලිය: රු.25,000/- + VAT වේ.
- තෝරාගත් ලංසුකරු විසින් මාසික කුලියට අමතරව රු.10,000/- ක් (එක් වෙළඳ කුටියක් සඳහා) නඩත්තු ගාස්තු ලෙස ගෙවිය යුතුය.
- තෝරාගත් ලංසුකරු විසින් විදුලි බිල්පත් ගෙවිය යුතුය.

ලංසුකරුගේ අත්සන :- …………………………………………….

නම :- …………………………………………….

ජා. හැ. අංකය :- …………………………………………….

ලිපිනය :- …………………………………………….

දුරකථන අංකය :- …………………………………………….

**සාක්ෂි 01**

අත්සන :- ……………………………………………

නම :- …………………………………………….

ජා. හැ. අංකය :- …………………………………………….

ලිපිනය :- …………………………………………….

**සාක්ෂි 02**

අත්සන :- ……………………………………………

නම :- …………………………………………….

ජා. හැ. අංකය :- …………………………………………….

ලිපිනය :- …………………………………………….

**Annexure 1**

## SPECIMEN FORM OF TENDER SECURITY

…………………………………..
…………………………………..
…………………………………..
(Name & Address of Guarantor)

Read Only

**Beneficiary;**
General Manager,
Sri Lanka Land Development Corporation,
No 03,
Sri Jayawardenapura Mawatha,
Rajagiriya.

Whereas, .................................................... (name of tenderer) (hereinafter called and referred to as " the Tenderer "), has submitted its Tender dated ...................... (date) for the “Renting of Premises at Pagoda Wetland Park to Construct and Operate Two Nos. of Food Stalls.” (hereinafter called and referred to as " the Tender"). KNOW ALL PEOPLE by these presents that WE.................................................... (name of organization) having our registered office at ............................................ (hereinafter called and referred to as "the Guarantor"), are bound unto “General Manager, Sri Lanka Land Development Corporation, No 03, Sri Jayawardenapura Mawatha, Rajagiriya” (hereinafter called and referred to "the Employer") in the sum of Sri Lanka Rupees 30,000.00 for which payment well and truly to be made to the said Employer. The Guarantor binds itself, its successors, and assignees by these presents.
SEALED with the Common Seal of the said Guarantor this .......................... day of ............................
We undertake to pay the Employer unconditionally up to the above amount upon receipt of its first written demand, without the Employer having to substantiate its demand provided that in its demand the Employer will note that the amount claimed by it is due to it, specifying the occurred condition or conditions.

This Guarantee will remain in force up to …………………. and any demand in respect thereof shall be received by us no later than the above date.

DATE ................................
SIGNATURE OF THE GUARANTOR ...........................................

WITNESS.............................
SEAL..................................................
(Signature, Name and Address)

Read Only

(ඇමුණුම් අංක 02)

## <u>ව්‍යාපාර යෝජනාව</u>

වෙළඳ කුටි අංක 01

(ඇමුණුම් අංක 03)

# ව්‍යාපාර යෝජනාව

වෙළඳ කුටි අංක 02